ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association

Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.09.22 *චක්‍රලේඛ අංක : 78 /2026*

*සියළුම දිසා කොමසාරිස්වරුන් වෙත,*

**<u>11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය - 2027</u>**
**<u>දිසා ජම්බෝරි කළමනාකරණ කමිටු රැස්වීම</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයට වසර 115ක් පිරීම නිමිත්තෙන් පවත්වනු ලබන 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය 2027.01.17 සිට 23 දින දක්වා දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී ජාත්‍යන්තර මට්ටමින් පැවැත්වීමට මේ වන විට කටයුතු සංවිධානය කරමින් පවතී.

ජම්බෝරියේ දිසා සංවිධාන කටයුතු පහසු කරගැනීම සඳහා පත් කරන ලද දිසා ජම්බෝරි කළමනාකරණ කමිටු රැස්වීමක් 2026.10.03 දින පස්වරු 01.00 ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.
මේ සඳහා ඔබ දිසාවේ,

1. දිසා කොමසාරිස් (අනුශාසක)
2. ජම්බෝරි දිසා කණ්ඩායම් නායක
3. ජම්බෝරි දිසා නියෝජ්‍ය කණ්ඩායම් නායක
4. ලියාපදිංචි කිරීමේ දිසා නිලධාරි

යන මහත්ම/මහත්මීන් අනිවාර්යෙන් ම නියමිත වේලාවට සහභාගී කරවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙදින රැස්වීමේදී ජැම්බෝරියේ කටයුතු පිළිබඳ මූලික හඳුන්වාදීමක් සිදුකරන අතර ඉන් අනතුරුව ජැම්බෝරියේ ලියාපදිංචි කටයුතු පිළිබඳ පූර්ව පෙරහුරුවක් සිදුකිරීමට නියමිතය. ඒ සඳහා අවශ්‍ය වන බැවින් laptop පරිගණකයක් හා මේ වන තෙක් ඔබ දිසාව තුළ ලියාපදිංචි වූ බාලදක්ෂයින් හා නායක/නායිකාවන් සංඛ්‍යාව ඇතුලත් Excel පත්‍රිකාව ද මෙදිනට රැගෙන ආ යුතුය.

මේ සඳහා ඔබෙන් ලැබෙන සහය ඉතා අගය කරමි.

ස්තූතියි

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

*නීතිඥ මනෝජ් නානායක්කාර*
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

පිටපත්:- ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
සියළුම ජම්බෝරි කමිටු ප්‍රධානීන් වෙත.

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk